# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2178/26 - 2020 ජුනි මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2020.06.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

*මගේ අංකය :* IR/COM/01/2017/111

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.03.20 දිනැති හා අංක 2063/22 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2018.03.16 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කොළඹ 04, බම්බලපිටිය, ගාලු පාර, අංක 37/ඒ හි පදිංචි ඩී. අයි. එච්. ඒ. යටවර මිය සහ බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234හි පිහිටි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2020.01.28 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 පෙබරවාරි මස 26 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කාර්මික අධිකරණයේ දී ය.

ඩී, අයි. එච්. ඒ. යටවර,
අංක 37 ඒ, ගාලු පාර,
බම්බලපිටිය

නඩු අංකය : A/22/2018
IR/COM/01/2017/III

එදිරිව

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.

අතර පවත්නා කාර්මික ආරාවුල

**ප්‍රදානය**

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලා තන්තිරිගේ දොන් ජෝන් සෙනවිරත්න මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියැවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2018.03.16 වැනි දින බේරුම්කරු වශයෙන් මා පත් කර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ, "ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මාණ්ඩලික සහකාරවරියක ලෙස සේවය කරන ඩී. අයි. එච්. ඒ. යටවර මහත්මියට එරෙහිව විනය පරීක්ෂණයක් පවත්වා සභාපතිගේ අංක AD/215/157/2013 හා 2016.12.06 දිනැති ලිපිය මගින් අදාළ විනය නියෝගය සංශෝධනය කර දඬුවම් ලබාදීම යුක්ති සහගත ද යන්න හා එසේ යුක්ති සහගත නොවන්නේ නම් ලබාදිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ".

**පසුබිම සහ සාක්ෂි සාරාංශය :**

පළමු පාර්ශවය විසින් සිය පළමු ප්‍රකාශය 2018 ක් වූ අප්‍රේල් මස 03 වන දින ඉදිරිපත් කර ඇති අතර දෙවන පාර්ශවය විසින් නඩු විස්තර ප්‍රකාශයේ නියමිත දිනට පසුව 2018.05.24 දිනැතිව එවා ඇත. මීට අමතරව ඉල්ලුම්කාර පාර්ශවයේ දෙවන ප්‍රකාශය 2018.06.14 වැනි දින ලබා දී ඇති අතර එයට පිළිතුරු ප්‍රකශයක් 2018.06.25 වැනි දිනට පෙර ඉදිරිපත් කරන මෙන් දෙවන පාර්ශවයට දන්වා යැවුනද දෙවන පාර්ශවය විසින් නැවතත් නියමිත දිනට පසුව ප්‍රමාදවී තම ප්‍රකාශය 2018.08.03 වැනි දින ඉදිරිපත් කර ඇත.

දෙපාර්ශවයේම ඉහත කී ප්‍රකාශයන් ද සලකා බලා 2018.08.16 වැනි දින මෙම නඩුව පළමු වරට විභාගයට ගන්නා ලද අතර පළමු පාර්ශවය සිය නියෝජිත ග්‍රේෂන් සිල්වා මහතා සමග පෙනී සිටින ලද අතර දෙවන පාර්ශවය (ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙනුවෙන්) සහකාර කළමණාකර මානව සම්පත් අංශයේ ඩී. එල්. එස්. කේ. ගුණරත්න සහතා සමග කළමණාකාර සහකාර ඩබ්. එල්. ඩී. සී. නවරත්න මෙනවිය පෙනී සිටින ලදී.

මෙම නඩුවේ පළමු පාර්ශවය වන ඉල්ලුම්කාරියගෙන් මූලික සාක්ෂි විමසීම මෙදින සිදු කරන ලදී. ඒ අනුව සාක්ෂිකාරිය සිය සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත්තේ තමන් 1997.10.01 වැනි දින මාණ්ඩලික සහකාර තනතුරට පත් වූ බවත් 2013 ඔක්තෝබර් වන විට මාණ්ඩලික සහකාර තනතුරේ S 1 ශ්‍රේණියේ සේවය කළ බවත්, මුදල් අංශයට අනුයුක්තව සේවය කළ බවත් ය. තව ද තමන් සහකාර ගණකාධිකාරී එම්. ඒ. පී. ප්‍රියදර්ශන මහතාගේ අධීක්ෂණය යටතේ බැංකු සැසඳුම් පිළියෙල කිරීම සිදු කළ බවත් අතරතුර තමාට චෝදනා පත්‍රයක් ලැබුණු අතර, එකී චෝදනා පත්‍රය ලැබීමට පෙර මූලික පරීක්ෂණයක් පැවැත්වූ බව ද වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. මේ හැර වගඋත්තරකාර දෙවන පාර්ශවයේ සභාපතිවරයා විසින් ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට අනුව විනය පරීක්ෂණයක් පවත්වා 2013.10.11 දිනැතිව පිටු 09කින් සමන්විත චෝදනා පත්‍රයක් නිකුත් කළ බවත් එය ඒ 1 වශයෙන් ලකුණු කරමින් කියා සිටී. මීට අමතරව විනය පරීක්ෂණය පවත්වාගෙන යන අතරතුර 2014.12.22 වැනි දින තමන්ට සංශෝධනය කරන ලද චෝදනා පත්‍රයක් ලබා දුන් බව එය ඒ - 2 වශයෙන් ලකුණු කරමින් සඳහන් කර සිටී.

තව ද මෙලෙස තමන්ට චෝදනා පත්‍ර නිකුත් කරන ලද්දේ තමන් බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ රාජකාරි කරන අවස්ථාවේ වංචනිකව මාරු කර ගත් චෙක්පත් දෙකක් සම්බන්ධයෙන් කරුණු අනාවරණය කරගෙන එය කළමණාකාරිනී මුදල් වෙත දැනුම් දුන් පසුව පළමු පාර්ශවයේ සාක්ෂිකාරිය වැඩිදුරටත් සාක්ෂි ලබා දී ඇත. ඉහතින් සඳහන් කළ විනය පරීක්ෂණයට පසුව 2015.07.29 වැනි දින දෙවන පර්ශවයේ සඳහන් ආයතනයේ සභාපතිවරයා වන විනය බලධාරියා විසින් තමුන්ට විනය නියෝගයක් නිකුත් කළ බවත්, එය සිය සාක්ෂියේ දී ඒ - 3 වශයෙන් ලකුණු කරමින් කියා සිටී. තව ද එකී ඒ - 3 ලේඛනයේ කොටසක් ඒ - 3 (ඒ) වශයෙන් සලකුණු කරමින් එකී කොටස අනුව තමන් චෝදනා පත්‍රයේ සඳහන් සියලු චෝදනාවලින් නිදොස් කොට නිදහස් කර ඇති බව ද වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී. එසේ නිදොස් කොට නිදහස් කිරීම විනය බලධාරියා විසින් සිදු කළ බව වැඩිදුරටත් කියා සිටී.

එසේ චෝදනාවලින් නිදොස් කොට නිදහස් වූ පසුව තමන්ට පරිපාලන නිලධාරි වශයෙන් උසස් වීමක් ලැබුණු බවත්, එය තමා සේවය කළ ආයතනයේ පත්වීම් බලධාරියා සහ විනය බලධාරියා වන සභාපතිවරයා විසින් ලබා දුන් බව ද සිය සාක්ෂියේ දී පළමු පාර්ශවය විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී. 2015.08.26 දිනැතිව එම් 6 ශ්‍රේණියට පරිපාලන නිලධාරි වශයෙන් පත්වීමේ දී පත්වීම් ලිපිය ඒ - 4 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කර සිටී. එකී පත්වීම් ලිපිය 2020.04.05 වැනි දින සිට බලාත්මක වන බව ද ඒ - 4 වශයෙන් සලකුණු කළ ලේඛනයේ අදාළ කොටස ඒ - 4 (ඒ) වශයෙන් ලකුණු කරමින් කියා සිටින අතර තමන් එකී තනතුරේ සේවය කළ බව ද කියා සිටී. ඉන් පසුව හිටි හැටියේ වගඋත්තරකාර ආයතනයේ සභාපතිවරයා විසින් 2016.12.06 දිනැතිව එකී විනය නියෝගය "සංශෝධනය කිරීමේ සිරසින් යුතුව" තමා වෙත ලිපියක් නිකුත් කර ඇති බවත් සිය සාක්ෂියේ දී එකී ලිපිය ඒ - 5 ලෙස සලකුණු කරමින් ප්‍රකාශ කර සිටී. එය වර්තමාන රජය බලයට පත්වීමෙන් පසුව කර ලද සංශෝධනයක් බව ද වැඩිදුරටත් කියා සිටී. එකී විනය දඬුවම් 04ක් අඩංගු ලේඛනය වශයෙන් සලකුණු කර සිය සාක්ෂියේදී ඉදිරිපත් කරමින් වැඩිදුරටත් කියා සිටින්නේ සියලු චෝදනාවලින් නිදහස්වූ තමුන්ට එවැනි දඬුවම් දීමේ හැකියාවක් නොමැති බවත් එසේ එසේ දඬුවම් පමුණුවන්නේ කවර රෙගුලාසි යටතේ ද යන්න පිළිබඳව තමාව දැනුවත් කර නොමැති බවත් ය.

තව ද ඒ - 5 (ඒ) අනුව පළමු විනය දඬුවම වන ලක්ෂ දෙකක මුදල තමාගේ වැටුපින් රුපියල් 5,000.00 බැගින් අඩු කිරීම අසාධාරණ බවත්, එකී අඩු කිරීමෙන් තමා නිදහස්කරන ලෙසත් ඒ - 5 (ඒ) අනුව තමාගේ වැටුප් වර්ධක දෙකක් විලම්භනය කර ඇති අතර එම නියෝගය අවලංගු කරන ලෙසත්, තෙවන චෝදනාවෙන් තමා මුදල් අංශයේ සේවයේ නොයෙදවීම කර ඇති අතර ඒ පිළිබඳව හබ කරන බවත්, හතර වන චෝදනාව අනුව තමන්ගේ ශ්‍රේණිය පහත හෙළීම නිසා තමන්ට උසස්වීම් අහිමි කිරීම අසාධාරණ බවත් ඒ අනුව නැවත හිග වැටුප් සමග එම ශ්‍රේණියට පත් කරන ලෙසත් ඉල්ලා සිටී.

2018.01.02 වැනි දින මෙම නඩුව නැවත විභාගයට ගත් අතර, ඉල්ලුම්කාර පාර්ශවයේ පෙනී සිටීම පෙර පරිදිම විය.

වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් සහකාර කළමණාකාර බී. එල්. එස්. කේ. ගුණරත්න මහතා සමග නිතීඥ රොහාන් විජේසේන මහතා පෙනී සිටින ලදී.

මෙදින වගඋත්තරකාර පාර්ශවය විසින් ඉල්ලුම්කාර පාර්ශවයේ සාක්ෂිකාරියගෙන් හරස් ප්‍රශ්න විමසීම සිදු කරන ලදි. එහි දී වගඋත්තරකාර පාර්ශවය විසින් ඉල්ලුම්කාරියගේ සේවා කාලය සහ රාජකාරී කටයුතු කවරේද යන්න විමසා සිටි අතර සේවා කාලය 1998 සිට ආරම්භ කළ බවත්, එදින සිටම බැංකු සැසඳුම් පිළියෙල කිරීම තමා විසින් සිද කළ බවත් 2009 සැප්තැම්බර් මාසය වන විටත් බැංකු සැසැඳුම් පිළියෙල කිරීම සිදු කළ බවටත් ඉල්ලුම්කාරිය පවසා සිටින ලදී. එකී රාජකාරී කටයුතු පිළිබඳව තවදුරටත් විස්තර කරන මෙන් වගඋත්තරකාර පාර්ශවය විසින් ප්‍රශ්න කිරීමේදී ඉල්ලුම්කාරිය ප්‍රකාශ කළේ තමන් කාර්යාංශයට අයත් 1650 යන ගිණුම සම්බන්ධව බැංකු සැසඳුම් පිළියෙල කරන බවත් කෙසේ වුව ද එකී කටයුතු සඳහා බැංකුවෙන් ලැබෙන ප්‍රකාශය (STATEMENT) තමාට ප්‍රමාද වී ලැබෙන බවත් ය. එකී ප්‍රකාශය පරිපාලන නිලධාරිගේ කටයුතු සඳහා ලබා ගන්නා බවත් තවත් නිලධාරින් දෙදෙනෙකු ද එකී බැංකු රිසිට්පත් සංසන්දය කිරීමෙන් පසුව තමාට එකී රිසිට්පත් ලැබෙන බව ද ඉල්ලුම්කාරිය වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

වගඋත්තරකාර පාර්ශවය විසින් නඩුවට අදාළ මුදල් අවභාවිතා වීම සම්බන්ධයෙන් ප්‍රශ්න ගත වූ කාලය පිළිබඳව ඉල්ලුම්කාරියගෙන් විමසා ඇති අතර ඇය ප්‍රකාශ කර ඇත්තේ නිශ්චිත දිනයක් මතක නැති බවයි. එමෙන්ම වගඋත්තරකාර පාර්ශවය ඉල්ලුම්කාරිය විසින් සලකුණු කර අධිකරණයට ඉදිරිපත් කර ඇති ඒ - 1, ඒ - 2 ලේඛන ගැන විමසා සිටි අතර ඒවා ඇයට වගඋත්තරකරු විසින් ඉදිරිපත් කළ චෝදනා පත්‍ර වන අතර එහි චෝදනා 10ක් සඳහන්ව ඇති බවත්, එකී චෝදනවලින් තමන් නිදෝස් කොට නිදහස් වූ බව පමණක් දැනගන්නට ලැබුණ බව ඉල්ලුම්කාරිය ප්‍රකාශ කරන ලදී. වගඋත්තරකාර පාර්ශවය විසින් ඉල්ලුම්කාරියගෙන් වැඩිදුරටත් ප්‍රශ්න කිරීමේ දී ඉල්ලුම්කාරිය පවසා ඇත්තේ ඇය සියලු චෝදනාවලින් නිදොස් වූ පසු පරිපාලන නිලධාරි තනතුර සඳහා උසස් වීමක් ලැබුණු අතර එකී තනතුරෙහි සේවය කරමින් සිටින අතරතුර දඬුවම් පමුණුවා නැවත විනය සංශෝධනය කිරීමේ ලිපියක් ලැබූ බවකි. එකී ලිපිය ඒ - 5 වශයෙන් සලකුණු කර ඇති බවත් ය.

මෙහි දී වැඩිදුරටත් විනය නියෝගය සංශෝධනය කිරීම පිළිබඳව වගඋත්තරකාර පාර්ශවය විසින් ඉල්ලුම්කාරියගෙන් විමසා සිටින ලදී.

(අ) එකී සංශෝධනයට අදාළ කාර්ය පටිපාටිය දන්නේ ද යන්න ඉල්ලුම්කාරියගෙන් විමසීමේදී ඇය ඒ ගැන නොදන්නා බවට සාක්ෂි දී ඇත.

(ආ) තව ද ඉල්ලුම්කාරිය නිදොස් කොට නිදහස් කිරීම සම්බන්ධව විනය බලධාරියා වන විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපතිවරයා විසින් අමාත්‍යාංශ ලේකම් වෙත ලිඛිතව දන්වා ඇති බවට (සමාන්‍යාධිකාරිවරයාට පිටපත් ද සහිතව) වගඋත්තරකාර පාර්ශවය විසින් ඉල්ලුම්කාරියට යෝජනා කර සිටී. මෙහි දී ද ඉල්ලුම්කාරිය පවසා ඇත්තේ මේ ගැන තමා දැනුවත්ව නැති බවත්, එකී ලේඛනයක පිටපතක්වත් තමා වෙත එවා නොමැති බවයි.

(ඇ) වගඋත්තරකාර පාර්ශවය විසින් තවදුරටත් සාක්ෂිකාරියගෙන් හරස් ප්‍රශ්න විමසමින් තමන්ට විනය නියෝගය ලැබුණු පසු කළමණාකාරීත්වය වෙත සාක්ෂිකාරිය විසින් ලිපි ලේඛන හුවමාරු කිරීමක් සිදු කළේ ද යන්න විමසා ඇත. මෙහි දී සාක්ෂිකාරිය ප්‍රකාශ කර ඇත්තේ තමන්ට උසස් වීම් සඳහා වැටුප් ලබා නොදීම සම්බන්ධයෙන් ලිපි කිහිපයක් සභාපති, සමාන්‍යාධිකාරීතුමා සහ ක්‍රියාකාරී අධ්‍යක්ෂතුමාට යොමු කළත් කිසිම අවස්ථාවක එකී ඉහළ කළමණාකාරීත්වය සමඟ සාකච්ඡා නොකළ බවයි.

(ඈ) වගඋත්තරකාර පාර්ශවය සාක්ෂිකාරියගෙන් වැඩිදුරටත් සාක්ෂි විමසමින් පවසා සිටින්නේ අමාත්‍යාංශ ලේකම්වරයා මෙම විෂය ගත ගැටළුව 2016.10.21 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව 128/2016 (M - 10) මගින් අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කළ බවයි. සාක්ෂිකාරිය ඒ ගැන නොදන්නා බව ප්‍රකාශ කර සිටී. තව ද එසේ යොමු කිරීමට පසුව අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ලබා දී දඬුවම් තීරණය කළ බවට වගඋත්තරකාර පාර්ශවය සාක්ෂිකාරියට යෝජනා කරයි.

(ඉ) තවදුරටත් වගඋත්තරකාර පාර්ශවය සාක්ෂිකාරියට යෝජනා කර සිටින්නේ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක ඒ. 32.74.03 මගින් සාක්ෂිකාරියට ලබා දී අති විනය නියෝගය සංශෝධනය කර ඇති බවයි. මෙම නඩුවේ ඉල්ලුම්කාර සාක්ෂිකාරිය ප්‍රකාශ කර සිටින්නේ ඉහත කී කරුණු සම්බන්ධයෙන් තමා නොදන්නා බවයි. තව ද වගඋත්තරකරු විසින් එසේ යෝජනා කරමින් සඳහන් කර ඇති ලේඛන සම්බන්ධව තමා නොදන්නා බව ද ඉල්ලුම්කාරිය වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී. වගඋත්තරකාර පාර්ශවය තවදුරටත් සාක්ෂි විමසමින් 2015.08.03 දිනැතිව කාර්යාංශ සභාපතිවරයා විසින් විදේශ අමාත්‍යාංශ ලේකම්වරයාට යොමු කළ ලිපිය සාක්ෂිකාරියට පෙන්වා එක්ස් - 1 වශයෙන් ලකුණු කර සිටී. සාක්ෂිකාරිය පවසා සිටින්නේ එවැනි ලේඛනයක් පිළිබඳව තමන් මීට පෙර දැනුවත්ව නොසිටි බවයි. කෙසේ වුව ද අවවාදාත්මක ලිපියක් ඉල්ලුම්කාරියට ලැබී ඇති බව ඇය සිය සාක්ෂියේ දී පිළිගනී. මේ හැර 2015.11.12 වැනි දින අමාත්‍යාංශ ලේකම්වරයා විසින් වගඋත්තරකාර පාර්ශවය වෙත යොමු කර ඇති MFE/1A/17/1 දරන ලිපිය එක්ස් - 2 වශයෙන් සාක්ෂිකාරිය මගින් ලකුණු කොට ඉදිරිපත් කර ඇත. තව ද එකී ලිපියේ සඳහන් අමාත්‍යාංශ ලේකම්වරයාගේ උපදෙස් පරිදි කාර්යාංශය විසින් අංක 138/2016 (එම් - 10) අංක යටතේ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් අදාළ ගැටළුව පිළිබඳව අධ්‍යක්ස මණ්ඩලයේ සාකච්ඡාව සඳහා ඉදිරිපත් කළ බවත්, වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කරමින් එය සාක්ෂිකාරිය වෙත යොමු කර සිටී. සාක්ෂිකාරිය ඒ ගැන තමන් නොදන්නා බව ප්‍රකාශ කරන ලදී.

සාක්ෂිකාරියගෙන් තවදුරටත් සාක්ෂි විමසමින්, 1985 අංක 21 දරන විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 4 (3) වගන්තිය යටතේ නිලධාරීන් පත් කිරීම. පාරිශ්‍රමික ගෙවීම. සේවය අවසන් කිරීම, ආදී කටයුතු කිරීම කාර්යාංශයට බලය පැවරී ඇති බව වගඋත්තරකාර පාර්ශවය යෝජනා කර සිටින අතර ඒ සම්බන්ධයෙන් ඉල්ලුම්කාරිය ප්‍රකාශ කර සිටින්නේ ආයතන සංග්‍රහයට අනුව තමාට චෝදනා පත්‍රයක් ලබා දී ඇති බවත් කාර්යංශයේ සභාපතිවරයාට විනය නියෝගය ක්‍රියාත්මක කිරීම පිළිබඳව බලය පැවරීමක් ඇති බව තමන් නොදන්නා බවත් ය. තව ද කාර්යංශයේ විනය බලධාරීන් ලෙස ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුකූලව සභාපතිවරයා විසින් තමාට විනය නියෝගයක් නිකුත් කර ඇති බව සාක්ෂිකාරිය සිය සාක්ෂියේදී වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. කෙසේ වෙතත් දී ඇති විනය නියෝගය සලකා බැලීමට යොමු කර ඇති බව තමන් නොදන්නා බව සාක්ෂිකාරිය වැඩිදුරටත් කියා සිටී. එමෙන්ම වගඋත්තරකරු සිය හරස් ප්‍රශ්නවලදී වැඩිදුරටත් යෝජනා කර ඇත්තේ ඉල්ලුම්කාරියට ලබා දුන් විනය නියෝගය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නැවත සලකා බලා ලබා දුන් තීරණය විනිවිදභාවයෙන් සහ අපක්ෂපාතීව නීත්‍යානුකූලව ලබා දුන් බවයි. ඉල්ලුම්කාරිය සිය සාක්ෂියේදී එකී යෝජනාවත් ප්‍රතික්ෂේප කර සිටී.

ඉල්ලුම්කාරියගෙන් නැවත ප්‍රශ්න විමසීමේ දී ඇය ප්‍රකාශ කර ඇත්තේ එක්ස් - 1 ලේඛනයේ අදහස් පරිදි ලංකා බැංකු ආයතන ශාඛාවේ අංක 1650 දරන ගිණුමට අයත් චෙක්පත් දෙකකින් වංචනික ලෙස මුදල් ලබා ගත් බවට චෝදනා කරඇතත් එවැන්නක් තමන් විසින් නොකළ බවයි. එමෙන්ම චෙක්පත් ලැබීමට වවුචරයන් හෝ පිළියෙල කිරීම තමා නොකළ බවත්, චෙක්පත් අත්සන් කිරීම ද තමා නොකළ බවත් ප්‍රකාර කර සිටී. තව ද විනය නියෝගය සංශෝධනය කිරීම පිළිබඳව තමන්ට ලැබුණු අධිකරණයේ ඒ - 5 වශයෙන් සළකුණු කළ ලිපියෙහි හෝ එක්ස් - 2 ලෙස සලකුණු කළ ලිපියෙහි අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් අනුව සංශෝධිත විනය නියෝගය නිකුත් කරන බවට සඳහනක් හෝ නොමැති බව සාක්ෂිකාරිය සිය සාක්ෂියේදී වැඩිදුරටත් කියා සිටී. ඒ අනුව තමා නිදොස් කොට නිදහස් කළ විනය නියෝගය සංශෝධනය කිරීමෙන් තමන්ට දැඩි අගතියක් වූ බව ද ප්‍රකාශ කර සිටී. තව ද පළමු පාර්ශවය ඒ - 1 සිට ඒ - 5 දක්වා ලේඛන ලකුණු කරමින් සිය සාක්ෂිය අවසන් කර සිටී.

2018.12.19 වැනි දින මෙම නඩුව නැවත විභාගයට ගත් අවස්ථාවේ දෙවන පාර්ශවය නොහොත් වගඋත්තරකාර පාර්ශවය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ "කළමණාකාර පරිපාලන හා මානව සම්පත් කේ. ඒ. ඩී. සුසිල් කුමාර කුමාරපේලි මහතා සාක්ෂියට කැඳවා සාක්ෂි විමසීම ආරම්භ කර ඇත. එකී සාක්ෂිකරු සිය සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත්තේ තමා 1991 වර්ෂයේ ජුනි මස විදේශ සේවා නියුක්ති කාර්යංශයේ සේවයට පත් වූ බවත්, මානව සම්පත් අංශයේ රාජකාරී කටයුතු අධීක්ෂණය තමාට පැවරී ඇති බවත් ඉහත කී ධුරයට තමා පත්වූයේ 2018.04.02 වැනි දින බවත් ය. මෙම ගැටළුව සම්බන්ධයෙන් සාක්ෂිකරු ලිපි ලේඛනවලට පිළිතුරු ලබා දීමෙන් සම්බන්ධ වූ බවත්, 2018 අප්‍රේල් මස 02 වැනි දිනට පසුව මේ සම්බන්ධව රාජකාරී කටයුතු කළ බවත් වැඩිදුරටත් පවසා සිටී. තවද මෙම ගැටළුව සම්බන්ධයෙන් තමන්ට ගොනුව බලා සාක්ෂි දීමේ හැකියාව පවතින බව කියා සිටිමින් ඒ අනුව සාක්ෂිදීම සිදු කරන ලදී. සාක්ෂිකරුගේ සාක්ෂිය අනුව ඉල්ලුම්කාරිය එනම් මෙම නඩුවේ පැමිණිලිකාරිය 1997 ඔක්තෝබර් මස කාර්යාංශයේ සේවයට බැඳී ඇති බවත් ඇය මාණ්ඩලික සහකාර තනතුර සඳහා පත්ව ඇති බවත් තහවුරු වේ. 2013 ඔක්තෝබර් මස මෙම ගැටළුව උද්ගත වන අවස්ථාව වන විට ඇය මුදල් අංශයේ කටයුතු කළ අතර, ඇයට ලබා දුන් රාජකාරී ලැයිස්තුවක් ලිපි ගොනුවේ නොමැති බව ද කියා සිටී. කෙසේ වෙතත් ඇය බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ කටයුතුවල යෙදී සිටි අතර මාණ්ඩලික සහකාර තනතුරේ සේවය කළ බව ද වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී.

ලේඛන ගත තොරතුරු පරීක්ෂා කරමින් වගඋත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ "අභ්‍යන්තර විගණන අංශයෙන් කළ පරීක්ෂණයක් අනුව අස්ථාන ගත වූ චෙක්පත් දෙකක් මගින් කාර්යංශයට රුපියල් ලක්ෂ අටක මුදලක් අහිමි වීම සම්බන්ධයෙන් වූ ගැටළුවක් විදේශ රැකියා ප්‍රවර්ධන අංශය ලේකම්වරයා විසින් යොමු කළ පසු ඒ සම්බන්ධ රාජකාරී කටයුතුවලට තමන් සම්බන්ධ වූ බවයි. (මෙහි දී අමාත්‍යාංශ ලේකම්වරයා විසින් යොමු කළ ලිපිය එක්ස් - 5 ලෙස සලකුණු කරන ලදී.) සාක්ෂිකරු තවදුරටත් පවසා සිටින්නේ චෙක්පත් දෙකක වංචාවක් පිළිබඳව තොරතුරු ලැබුණු පසු මේ පිළිබඳව අභ්‍යන්තර විගණන අංශය මගින් පරීක්ෂණයක් පවත්වා ඉන් පසු විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා මෙම නඩුවේ ඉල්ලුම්කාරියට 2013.10.11 දිනැතිව චෝදනා පත්‍රය නිකුත් කර ඇති බවත් සහ එකී චෝදනා පත්‍රය දැනටමත් ඒ - 1 ලෙස ලකුණු කර ඇති බවත් ය. එකී චෝදනා පත්‍රය අනුව චෝදනා 10ක් ඇති අතර පැමිණිලිකාරිය චෝදනා 08කට වැරදිකරු වී ඇති බව ද ප්‍රකාශ කරන ලදී. තව ද ඉහත කී විනය පරීක්ෂණ වාර්තාව ඔප්පු කිරීමේ භාරයට යටත්ව එක්ස් 6 ලෙස සලකුණු කර සිටී. (එය පිටු 21කින් සමන්විත වේ.) තව ද එකී විනය පරීක්ෂණයෙන් පසුව 2015.07.29 දිනැතිව එවකට සිටි සභාපතිවරයා විසින් විනය නියෝගයක් ලබා දී ඇති බවත් එය ඒ - 3 ලෙස දැනටමත් සලකුණු කර ඇති බව ද කියා සිටී. එකී නියෝගය 2016.12.06 දිනැතිව සභාපතිවරයා විසින් සංශෝධනය කර ඇති අතර ඉල්ලුම්කාරියට දඬුවම් පමුණුවා ඇති බව ප්‍රකාශ කර ඇත. එම නියෝගය ඉල්ලුම්කාරිය විසින් ඒ - 5 වශයෙන් සලකුණු කර ඇති බව ද ප්‍රකාශ කර සිටී.

සාක්ෂිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ මුලින් ලබා දුන් විනය නියෝගය සම්බන්ධයෙන් තමා සෑහීමකට පත් නොවන බව 2015.11.12 දිනැති ලිපියෙන් අමාත්‍යාංශ ලේකම්වරයා දන්වා ඇති අතර ඒ අනුව සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවත් ය. අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු සහ සාමාන්‍යාධිකාරී ඇතුළත් කමිටුවක් පත්කර ඇති අතර එකී කමිටුවේ නිර්දේශ මත තීරණයක් ලබා දී ඇති බවත් එකී තීරණය සලකා බැලීමෙන් පසුව විනය නියෝගය සංශෝධනය කර නිකුත් කර ඇති බවත් පවසා සිටී. එකී සංශෝධිත විනය නියෝගය ඒ - 5 වශයෙන් අධිකරණය ඉදිරියේ ලකුණු කර ඇති බව ද කියා සිටී. තව ද එම පරීක්ෂනය පැවැත්වීම සඳහා

විනය නියෝගය ලබා දීමත් එය සංශෝධනය කිරීමක් කාර්යංශයේ පවත්නා විනය පටිපාටිය අනුව සිදු වූ බව සාක්ෂිකරු අවසාන වශයෙන් ප්‍රකාශ කරන ලදී.

වගඋත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීම 2018.12.26 වැනි දින සිදු වූ අතර, සාක්ෂිකරු විසින් මෙම නඩුවට අදළ ගැටළුව සිදු වූයේ 2013 ඔක්තෝබර් මාසයේ යනුවෙන් පෙර දින සාක්ෂියේ දී සඳහන් කිරීම නිවැරදි නොවන බව ඉල්ලුම්කාර පාර්ශවය අභියෝග කළ අතර ගැටළුව සිදු වූයේ 2009 වර්ෂයේ බව වගඋත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරු ද පිළිගනී.

වැඩිදුරටත් හරස් ප්‍රශ්න විමසීම 2019.01.07 වැනි දිනට යෙදී තිබුණු අතර, වගඋත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරු සාක්ෂි දෙමින් කියා සිටියේ විදේශ රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් ලැබුණු 2012.08.15 දිනැති ලිපිය එනම් එක්ස් - 5 වශයෙන් සලකුණු කර ඇති ලේඛනය අනුව මෙම ගැටළුව ගැන තමන් දැනුවත් වූ බවයි. තව ද ඒ වන විට 2015.07.25 දිනැතිව විනය නියෝගය නිකුත් කර තිබුණේ ද යන්නට "එසේ සිදුව නොමැති බව ද" සාක්ෂිකරු පවසා සිටී.

කෙසේ වුව ද මෙම ගැටළුව සිදු වුයේ චෙක්පත් දෙකක් අස්ථාන ගත වීමෙන් බව ද එකී චෙක්පත් බැංකුවෙන් මුදල් කර ගත්තේ කවරෙක්ද යන්න සඳහන් කිරීම අපහසු බවද මෙම සිද්ධිය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශයෙන් මූලික විමර්ශණයක් පවත්වූ බව ද වගඋත්තරකරු ප්‍රකාශ කර සිටී. ඉන් පසු විනය පරීක්ෂණයක් පවත්වා ඒ - 3 වශයෙන් දැනටමත් සලකුණු කර ඇති ලේඛනය අනුව ඉල්ලුම්කාරිය නිදෙස් කොට නිදහස් කර ඇති බව සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. තව ද එකී ඒ - 3 දරන විනය නියෝග ඒ - 5 වශයෙන් සලකුණු කර ඇති ලේඛනය මගින් සංශෝධනය කර දඩුවම් ලබා දී ඇති බව ද ප්‍රකාශ කර සිටී. කෙසේ වුව ද මුල් විනය නියෝගය අවලංගු කිරීමෙන් හෝ සංශෝධනය කිරීමක් සිදුව නොමැති බව ද වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී. තව ද විනය කටයුතු සම්බන්ධව ආයතන සංග්‍රහය අනුව කටයුතු කරන බව ද ප්‍රකාශ කර ඇත. එමෙන්ම එක්ස් - 2 වශයෙන් සලකුණු කළ ලේඛනය අනුව සභාපතිතුමා විනය නියෝගය ගැන අමාත්‍යාංශ ලේකම්වරයා දැනුවත් කළ බවත් එහි දී ලේකම්වරයා අදළ නියෝගය පිළිබඳව සෑහීමකට පත් නොවන බව දන්වමින් විනය නියෝගය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යෝජනාවක් කර ඇති බව ද වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී. එකී දැන්වීම සමග අමුණා ඇති විගණන නිලධාරියාගේ නිර්දේශ අඩංගු ලේඛනයේ නිලධාරියාගේ නිල මුද්‍රාව හෝ දිනය ද නොමැති බව ප්‍රකාශ කර සිටී.

තව ද විනය නියෝගය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කළ පසු කමිටුවක් මගින් කටයුතු කර ඇති බවත් එහි දී විනය නියෝගය සංශෝධනය කිරීමක් සිදුව නැති අතර, දඩුවම් දීමක් සිදුකර ඇති බව වගඋත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී.

කෙසේ වුව ද නැවත ප්‍රශ්න විමසීමේ දී සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ ඒ - 3 ලේඛනය මගින් ලබාදුන් නියෝගය සංශෝධනය කරමින් ඒ - 5 ලේඛනය මගින් දඬුවම් පමුණුවා ඇති බවයි. තව ද අධ්‍යක්ෂ මණ්ඩලය ගන්නා ලද තීරණයක් මත මෙලෙස විනය නියෝගය සංශෝධනය කර ඇති බව සාක්ෂිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී. දෙපාර්ශවය විසින් 2019.01.21 වැනි දින ලිඛිත දේශන ද ගොනු කර ඇති අතර නඩු විභාගය අවසන් කරයි.

**සාක්ෂි විශ්ලේෂණය සහ ප්‍රදනය ඉදිරිපත් කිරීමේ ස්ථාවරය :**

මෙම නඩුවේ දෙපාර්ශවයේම සාක්ෂි විමසීමේ දී පහත කරුණු අනාවරණය වේ.

එනම් :

01. ඉල්ලුම්කාරිය 1997.10.01 වැනි දින සේවයට පැමිණි බව සහ ඇය විසින් ආයතනයේ බැංකු සැසඳුම් පිළියෙල කිරීම කළ බව ඉල්ලුම්කාරියගේ මූලික සාක්ෂිය තුළින් ද වගඋත්තරකාර පාර්ශවයේ සාක්ෂි විමසීමේදී තහවුරුව ඇත.

02. එමෙන්ම ඉල්ලුම්කාරිය බැංකු සැසඳුම් පිළියෙල කිරීම් කටයුතුවල යෙදී සිටිය දී චෙක්පත් දෙකක් අවභාවිත වී ඇති බව තහවුරු කරගෙන එය ඉහළ කළමණාකාරීත්වයට ඉදිරිපත් කළ පසු ඒ පිළිබඳව ඉල්ලුම්කාරිය විනය පරීක්ෂණයකට භාජනය කොට 2015.07.29 දිනැති විනය නියෝගය (එනම් පැමිණිල්ල විසින් මෙම නඩුවේ ඒ - 3 වශයෙන් සලකුණු කළ ලේඛනය) නිකුත් කළ බව දෙපාර්ශවයේම සාක්ෂි සටහන් පරීක්ෂා කිරීමේ දී පෙනී යයි.

එකී විනය නියෝගය අනුව චෝදනා පත්‍රයේ සඳහන් සියලුම චෝදනාවලින් ඉල්ලුම්කාරිය නිදෙස් කොට නිදහස් කර ඇති බව ද දෙපාර්ශවය විසින්ම සිය සාක්ෂිවලදී පිළිගෙන ඇත.

03. ඉල්ලුම්කාරිය වෙත වගඋත්තරකාර පාර්ශවය විසින් ඉහත කී විනය නියෝගය එවීමෙන් වසර 01යි මාස 05කට පසුව 2016.12.06 දිනැතිව සංශෝධිත විනය නියෝගයක් නිකුත් කර ඇති බව දෙපාර්ශවයේම සාක්ෂිවලදී ප්‍රකාශ වී ඇත. ඒ අනුව විනය නියෝගයක් නිකුත් කිරීම හා සංශෝධනයක් ඉදිරිපත් වූ බව සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර හබ කිරීමක් නැත.

04. කෙසේ වුව ද ඉල්ලුම්කාරියගේ මූලික සාක්ෂියේ කරුණු සලකා බැලීමේ දී මෙම ගැටළුවට අදළ මූලික කරුණ වන්නේ ඉහත කී 2016.12.06 දිනැති විනය නියෝගය සංශෝධනයට හේතු කවරේද යන්න සහ කවර නීතිමය තත්වයක් යටතේ විනය නියෝගය සංශෝධනය වූයේ ද යන්න වේ. ඉල්ලුම්කාරියගෙන් 2018.08.16 වැනි දින මූලික සාක්ෂි විමසීමේ දී ඇය ප්‍රකාශ කර ඇත්තේ එකී විනය නියෝගය පමුණු වන්නේ අසවල් රෙගුලාසි යටතේ ද යන්න පිළිබඳවවත් තමන් දැනුවත්ව නොමැති බවයි.

ප්‍රශ්නය :

සියලු චෝදනාවලින් නිදෙස් කොට නිදහස් වූ තමන්ට මේ ආකාරයෙන් විනය දඬුවම් පමුණුවන්නේ අසවල් රෙගුලාසි අනුව ද කියලාවත් තමන් දැනුවත් කර තිබෙනවා ද? යන්නට

පිළිතුර :

"එහෙම දැනුවත්කර නැහැ" යනුවෙන් ප්‍රකාශ කර ඇත. ඇය වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ එසේ නිදොස් කොට නිදහස් වූ තමුන්ට එවැනි බරපතල දඬුවම් නියම කිරීමේ හැකියාවක් නොමැති බවත් එසේ නියම කිරීම අසාධාරන බවත් මේ හැර පළමු විනය නියෝගයෙන් නිදොස් කොට නිදහස් වූ ඉල්ලුම්කාරිය සේවයේ යෙදී සිටිය දී ඇයගෙන් කිසිදු විමසීමක් ලිඛිතව හෝ වාචිකව සිදු නොකොට වසර එකකුත් මාස 05කට පමණ පසුව විනය නියෝගය සංශෝධනය කර දඬුවම් පමුණුවා ඇති බව ඉල්ලුම්කාරියගේ සාක්ෂි විමර්ශනය කිරීමේ දී අනාවරණය විය.

05. කෙසේ වුව ද වගඋත්තරකාර පාර්ශවය විසින් 2018.10.02 වැනි දින ඉල්ලුම්කාරියගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී පහත පරිදි ලේඛන සලකුණු කරමින් ප්‍රශ්න සහ යෝජනාවන් ගණනාවක් ඉදිරිපත් කර ඇති අතර එතුළින් ඇය වෙත නිකුත් කර ඇති ඒ - 3 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කර ඇති විනය නියෝගය සංශෝධනය කිරීම සම්බන්ධයෙන් ඇයගේ දැනුවත් භාවය පිළිබඳව තහවුරු කිරීමට වගඋත්තරකාර පාර්ශවය උත්සහ ගෙන ඇත.

II. ප්‍රශ්නය : සාක්ෂිකාරිය තමුන් සියලු චෝදනාවලින් නිදොස් කොට නිදහස් කළා කියන ඒ - 3 ලෙස සලකුණු කෙළ ලේඛනයෙන් පසුව තවදුරටත් තමුන්ගේ මෙම විනය නියෝගය සම්බන්ධයෙන් කාර්යාංශ පටිපාටිය ගැන තමුන්ට අවබෝධයක් තියෙනවා ද සාක්ෂිකාරිය ? යනුවෙන් විමසා ඇති අතර,

උත්තරය : නැහැ ස්වාමිණී.

යනුවෙන් ඉල්ලුම්කාරිය පිළිතුරු දී ඇත. මෙකී පිළිතුර මගින් විනය නියෝගය සංශෝධනය පිළිබඳව කාර්ය පරිපාටිය ගැන ඉල්ලුම්කාරිය දැනුවත් නොවන බව ප්‍රකාශ කළ ද ඉල්ලුම්කාරිය වෙත ප්‍රශ්න සහ යෝජනාවන් ගණනාවක් ඉදිරිපත් කර ඇය එකී කාර්ය පරිපාටිය ගැන දැනුවත්ව සිටි බව තහවුරු කර ගැනීමට වගඋත්තරකාර පාර්ශවය ඇයගෙන් හරස් ප්‍රශ්න විමසමින් උත්සාහ ගෙන ඇත.

II. ප්‍රශ්නය : නන්දපාල වික්‍රමසිංහ සභාපතිතුමා 2015.08.03 වැනි දින අමාත්‍යාංශය වෙත මේ සිදු කරපු නිදහස් කිරීම සම්බන්ධයෙන් මෙම ගැටළුව සම්බන්ධයෙන් විදේශ අමාත්‍යාශයේ ලේකම්වරයා වෙත ලිඛිතව දැනුම් දීමක් කරලා තියෙනවා සාමාන්‍යාධිකාරියවරයාට ද පිටපත් සහිතව කියලා මෙම යෝජනා කරනවා ? යනුවෙන් විමසීමේ දී (අදාළ ලේඛනය එක්ස් - 1 වශයෙන් සාක්ෂි විමසීමේ දී සලකුණු කර ඇත.)

උත්තරය : පිළිගන්නේ නැහැ ස්වාමිණී. මම මේ ගැන දැනුවත් නැහැ ස්වාමිණී මට පිටපත් ලැබුණේ නැහැ ස්වාමිණී.

යනුවෙන් උත්තරය දී ඇත.

මේ අනුව එක්ස් - 1 ලේඛනය වගඋත්තරකාර පාර්ශවයේ ඉහළ පාලන අධිකාරිය අතර හුවමාරු වූ ලේඛනයක් බව සනාථ වුව ද, එහි පිටපතක් මගින් හෝ ඉල්ලුම්කාරිය දැනුවත් කිරීමට වගඋත්තරකාර පාර්ශවය අපොහොසත් වූ බව ඉහත කී ප්‍රශ්න කිරීම් සහ උත්තර මගින්ම තහවුරු වේ.

III. මේ හැර වගඋත්තරකාර පාර්ශවය ඉල්ලුම්කාරියගෙන් හරස් ප්‍රශ්න විමසමින් එක්ස් - 2 නමැති ලේඛනය සලකුණු කර ඉදිරිපත් කරමින් කරුණු විමසා ඇත.

ප්‍රශ්නය : සාක්ෂිකාරිය මම ඉහත කරපු 2015.08.03 වැනි දින ලිපියෙන් පසුව විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම් ඩී. එස්. විතානගේ මහතා විසින් 2015.11.12 දිනැති ලිපිය මගින් කාර්යාංශයේ සභාපතිතුමා වෙත දැනුම් දෙනවා විනය නියෝගය සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැකි බැවින් විනය නියෝගය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යෝජනාවක් ඉදිරිපත් කිරීමටත් කරුණු පැහැදිලි කරමින් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපතිවරයා වෙත දැනුම්දීමක් කර තිබෙන බව මම සාක්ෂිකාරියට යෝජනා කරනවා ද? යනුවෙන් විමසීමේ දී

උත්තරය : මම ඒ ගැන දැනුවත් නැහැ ස්වාමිණී මට ඒ සම්බන්ධයෙන් පිටපතක් ලැබුණේ නැහැ ස්වාමිණී.

යනුවෙන් පවසා ඇත. ඉහත කී ප්‍රකාශයන් තුළින් පැහැදිලි වන්නේ විනය නියෝගය සංශෝධනය කිරීමට වගඋත්තරකාර පාර්ශවය ගත් පියවර කුමක් ද යන්න සම්බන්ධවයි. කෙසේ වුව ද එකී පියවර පිළිබඳව ඉල්ලුම්කාරියට යෝජනාවක් ඉදිරිපත් කළ ද ඇය ඒ පිළිබඳව දැනුවත්ව නොසිටි බව උත්තරය මගින් අනාවරණය වේ. එමෙන්ම ලිපියේ පිටපතක් මගින් හෝ වගඋත්තරකරු විසින් එලෙස දැනුවක් කිරීමක් සිදු කර නොමැති බව ද තහවුරු වේ. මේ හැර තවුදුරටත් හරස් ප්‍රශ්න විමසමින් වගඋත්තරකාර පාර්ශවය විසින් ඉල්ලුම්කාරිය විනය නියෝගය සම්බන්ධව වගඋත්තරකාර පාර්ශවය සමග සාකච්ඡා කළේ ද යන්න විමසා ඇත.

ප්‍රශ්නය : සාක්ෂිකාරියට විනය නියෝගය ලැබුණට පසුව අවස්ථා කීයක් පමණ ඔබේ කළමණාකාරිත්වය වෙත තමුන්ගේ විනය නියෝගය සම්බන්ධයෙන් ලිපිලේඛන හුවමාරු කිරීමක් සිද්ධ කළා ද? යන්නට,

උත්තරය : උසස් වීම සඳහා වැටුප් ලබානොදීම සම්බන්ධයෙන් වාර ගණන මතක නැහැ. නමුත් ලිපි කීපයක් ලබා දුන්නා.

යනුවෙන් පිළිතුරු දී ඇත. මේ අනුව ඉල්ලුම්කාරියගෙන් හරස් ප්‍රශ්න විමසමින් වගඋත්තරකාර පාර්ශවය විසින් ඇය විනය නියෝගය ලැබුණු පසු වගඋත්තරකාර පාර්ශවය සමග ඒ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කළේ ද යන්න විමසා එතුළින් ඇය තමාට ලැබුණු නියෝගය සම්බන්ධයෙන් තවදුරටත් වගඋත්තරකාර පාර්ශවය සමග සම්බන්ධව කටයුතු කළ බව තහවුරු කිරීමට උත්සාහ ගත්ත ද එවැන්නක් සිදුව නොමැති බැවින් එකී ප්‍රයත්නය ද ව්‍යර්ථ වී ඇත.

IV. මේ හැර 2016.10.21 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව හෙවත් වගඋත්තරකාර පාර්ශවය විසින් ඉල්ලුම්කාරියගෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී ලකුණු කළ එක්ස් - 3 ලේඛනය ඉදිරිපත් කරමින් වගඋත්තරකාර පාර්ශවය ඉල්ලුම්කාරියගෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී යෝජනාවක් කර ඇත.

ප්‍රශ්නය : සාක්ෂිකාරිය නැවතත් මම අහන්නේ සාක්ෂිකාරිය පෙර සඳහන් කළ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් මෙම විෂය ගත ගැටළුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීමට කාර්යාංශය වෙත උපදෙස් ලබා දුන්නා කියලා. ඒ අනුව එම උපදේශය පදනම් කර ගෙන කාර්යංශය අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව 128/2016 (එම් - 10) මගින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මෙම ගැටළුව යොමු කර තිබෙනවා කියලා මම සාක්ෂිකාරියට යෝජනා කරනවා යන්නට,

පිළිතුරු : මා ඒ ගැන නොදනිමි ස්වාමිණී

යනුවෙන් පිළිතුරු දී ඇත.

V. තව ද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක ඒ 32.74.03 මගින් ඉල්ලුම්කාරියට ලබා දුන් විනය නියෝගය සංශෝධනය කිරීමට කටයුතු කර ඇති බව වගඋත්තරකාර පාර්ශවය ඊට අදළ ලේඛන එක්ස් - 4 ලෙස ඉදිරිපත් කරමින් ඉල්ලුම්කාරියට යෝජනා කර ඇත.

ප්‍රශ්නය : එම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කළාට පසුව ගැටළුව අධ්‍යක්ෂ මණ්ඩලය සාකච්ඡා කරලා තීන්දුවක් විනය නියෝගයක් මේ ගැටළුව සම්බන්ධයෙන් ලබා දීලා තියෙනවා. අදළ විනය නියෝගය, තමා වෙත ලබා දෙන ලද විනය නියෝගය සංශෝධනය කිරීම සඳහා ඒ 32.74.03 කියන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් කියලා මම යෝජනා කරනවා යනුවෙන් විමසීමේදී

උත්තරය : "මම ඒ ගැන නොදනිමි" ස්වාමිණී යනුවෙන් පවසා ඇත.

මේ අනුව වගඋත්තරකාර පාර්ශවය ඉල්ලුම්කාරියගෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී ඉහත සඳහන් පරිදි යෝජනාවලියක් ඇය වෙත ඉදිරිපත් කර එක්ස් - 1, එක්ස් - 2, එක්ස් - 3, එක්ස් - 4 ලේඛනය සම්බන්ධයෙන් ඉහත පරිදි ප්‍රශ්න කර තිබුණ ද එකී සියලුම ලේඛන ඉල්ලුම්කාරියගේ අනුදැනුමකින් තොරව විනය බලධාරියා වන සභාපතිවරයා, අමාත්‍යාංශ ලේකම්වරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය අතර හුවමාරු වූ ලේඛන පමණක් බව සාක්ෂි විමසීම තුළින්ම තහවුරු වේ. ඉල්ලුම්කාරිය වෙත එකී ලේඛන ඉදිරිපත් කර ඒ පිළිබඳව දැනුවත් භාවය සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවයේ නීතිඥවරයා විසින් ප්‍රශ්න කළ ද ඉල්ලුම්කාරිය ඒ පිළිබඳව දැනුවත් නොමැති බව ඇයගේ උත්තර ප්‍රකාශය තුළින් පැහැදිලි වේ. තව ද එසේ ඇය දැනුවත්වීමට එකී හුවමාරු වූ ලේඛනවල පිටපතක් හෝ තමන්ට එවා නොතිබූ බව ඇය ප්‍රකාශ කර ඇත.

තව ද ඉහත කී ලේඛනවල "ලිපි යොමුව" පරීක්ෂා කිරීමේ දී ද මෙම ලේඛන කිසිවක් ඉල්ලුම්කාරිය වෙත යොමු කර නොමැති බව ද පෙනේ. මේ අනුව ගැටළුව අදළ පාර්ශවයක් වන ඉල්ලුම්කාරිය දනුවත් නොකොට ඇයගෙන් කිසිදු කරුණක් නොවිමසා ආයතනයේ ඉහළ කළමණාකාරීත්වය විසින් ඒකපාර්ශවිකව මෙන්ම අත්තනෝමතිකව කටයුතු කරමින් විනය නියෝගය සංශෝධනය කොට ඉල්ලුම්කාරිය වෙත (ඒ - 5 වශයෙන් ඉල්ලුම්කාරියගේ මූලික සාක්ෂියේ දී ලකුණු කොට ඇති) සංශෝධිත විනය නියෝගය යන ශීර්ෂය යටතේ සඳහන් කර ඇති ලේඛනය ඉදිරිපත් කර ඇති බව ලබා දී ඇති සාක්ෂි මත නිගමනය කරමි.

තව ද සංශෝධිත විනය නියෝගය පැනවීම සම්බන්ධයෙන් ඉල්ලුම්කාරිය සිය පළමු ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ 2012.12.06 දිනැති එකී සංශෝධිත විනය නියෝගය මගින් අසාධාරන සහ අයුක්ති සහගතව දඬුවම් පමුණුවා ඇති අතර "එය වැහි නැති අකුණක ස්වරූපයක් ගත් බවයි" එසේ ප්‍රකාශ කිරීමට ඉල්ලුම්කාරියට අවස්ථාව ලැබී ඇත්තේ විනය නියෝගය සංශෝධනය කිරීමේ දී කිසිදු ලෙසකින් හෝ ඊට සම්බන්ධිත පාර්ශවයන් වන ඉල්ලුම්කාරිය දැනුවත් නොකොට එකී සංශෝධනයන් කළ බැවිනි. තව ද එකී සංශෝධනය සිදු කර ඉල්ලුම්කාරියට ඉදිරිපත් කරන්නේ අය මුල් විනය නියෝගයේ ප්‍රතිපාදන අනුව කටයුතු කරමින් සිට වසර එකකුත් මාස 05ක් ගත් වූ පසු යි. ඒ වන විට වගඋත්තරකරුවන් විසින්ම ඇයට උසස් වීමක් ද ලබා දී ඇත. එයින් පෙනී යන්නේ වසර එකහමාරකට ආසන්න කාලයක් මුල් විනය නියෝගය ඇය විසින් පිළිගත් අතර වගඋත්තරකරු ද එය පිළිගත් බවයි.

මේ අනුව ඉහතින් සඳහන් කළ පරිදි ඉල්ලුම්කාරියගෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී ඉල්ලුම්කාරිය විනය නියෝගය පිළිබඳව දැනුවත් බව වගඋත්තරකාර පාර්ශවය විසින් ඇය වෙත යෝජනාවලියක් යොමු කර තහවුරු කිරීමට උත්සාහ ගත්ත ද එසේ කිරීමට අපොහොසත්ව ඇති බව නිගමනය කරමි. එමෙන්ම යම් සිද්ධියකට අදළව පාර්ශවයන් දෙකක් සිටින අවස්ථාවක දී එකී දෙපාර්ශවයට සවන් නොදී එක පාර්ශවිකව තීරණ ගැනීම ස්වාභාවික යුක්ති මූල ධර්ම වල ප්‍රතිපාදන ද අනුගමනය නොකොට කටයුතු කිරීමක් බැවින් වගඋත්තරකාර පාර්ශවය විසින් ලබා දී ඇති සංශෝධිත විනය නියෝගය යුක්ති සහගත සහ සාධාරණ නොවන බව තීරණය කරමි.

VI. ඉල්ලම්කාරියට මුලින්ම විනය නියෝගය නිකුත් කර ඇත්තේ ඇයගේ විනය බලධාරියා වන වගඋත්තරකාර ආයතනයේ සභාපතිවරයා විසින් ය. තව ද විනය නියෝගය සංශෝධනය කර ඇත්තේ ද සභාපතිවරයා විසින්ම ය.

ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 26.1 වන වගන්තියට අනුව අමාත්‍ය මණ්ඩලය හැර වෙනත් විනය බලධාරියකු විසින් යම් විනය නියෝගයක් නිකුත් කිරීමෙන් පසුව එය එකී නියෝගය ප්‍රතිශෝධනය කිරීම හෝ වෙනස් කිරීම හෝ අහෝසි කිරීම හෝ එම විනය බලධාරියා විසින්ම සිදු කළ හැකි වන්නේ හුදෙක් එම විනය නියෝගයේ පවත්නා දෝශයක්, අක්‍රමවත් බවක් හෝ නිවැරදි කිරීමේ අවශ්‍යතාවයක් සඳහා පමණි. එසේ වෙනස් කිරීම හෝ අහෝසි කිරීම විනය බලධරයා විසින් තීරණය කරන අවස්ථාවක දී ඊට පදනම් වූ සියළුම කරුණු අදළ විනය ගොනුවේ පැහැදිලිව නිශ්චිතව සටහන් කළ යුතු ය යනුවෙන් ද ආයතන සංග්‍රහයේ දක්වා ඇත. එසේ වුවද පැමිණිලිකාරියට ලබා දුන් විනය නියෝගය සංශෝධනයේ දී ආයතන සංග්‍රහයේ සඳහන් එම ක්‍රියා පටිපාටිය වගඋත්තරකරු විසින් අනුගමනය කළ බවට සාක්ෂි කිසිවක් ඉදිරිපත් කර නැත. හුදෙක් ඒ - 5 නමැති ලේඛනයේ ලිපි ශීර්ෂයෙහි ''විනය නියෝගය සංශෝධනය කිරීම'' යන්න සටහන් කර ඇති අතර, නිකුත් කර ඇති විනය නියෝගය සංශෝධනය කරමින් දඬුවම් පමුණුවන බව සටහන් කර දඬුවම් පමුණුවා ඇත. මේ අනුව ඉහතින් ද සඳහන් කළ පරිදි විනය නියෝගය වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීමට පදනම් වූ කිසිදු හේතුවක් හෝ වෙනත් කරුණක් නිශ්චිතව සඳහන් කිරීමක් වගඋත්තරකාර පාර්ශවය විසින් අදළ සංශෝධන කාර්ය සිදු කිරීමේ දී සටහන් කළ බවට සාක්ෂි නොමැත. මේ අනුව මුල් විනය නියෝගය නිකුත් කිරීම ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අනුව සිදු කළ ද එය සංශෝධනය කිරීමේදී කිසිදු නිශ්චිත හේතු දැක්වීමක් වගඋත්තරකාර පාර්ශවය විසින් සිදු නොකිරීමෙන් ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන සැලකිල්ලට නොගෙන, එකී නීති රීති මෙන්ම ක්‍රියා පටිපාටිය අනුගමනය නොකර අත්තනෝමතිකව කටයුතු කර ඇති බව පෙනේ. ඒ අනුව එකී සංශෝධනය විධිමත් සංශෝධනයක් නොවන බව ද නිගමනය කරමි.

VII. ඉල්ලුම්කාර පාර්ශවය විසින් සිය සාක්ෂියේ දි ලකුණු කර ඇති ඒ- 5 ලේඛනය හෙවත් විනය නියෝගය සංශෝධනය කිරීමේ ශීර්ෂය යටතේ ඉල්ලුම්කාරිය වෙත එවා ඇති ලිපිය අනුව විනය නියෝගය සංශෝධනයට හේතු දෙකක් දක්වා ඇත. එනම්

i. ඉල්ලුම්කාරිය විසින් වරින් වර කරන ලද අභියාචනා මත සහ

ii. ආයතනයේ ඉහළ කළමණාකරිත්වය විසින් වරින් වර ගණු ලැබූ තීරණ යන කරුණු වේ.

ඉල්ලුම්කාරිය විසින් වරින් වර කරන ලද අභියාචනා මත විනය නියෝගය සංශෝධනය කළ බවට වගඋත්තරකාර පාර්ශ්වය විසින් කරුණු දක්වුව ද ඉල්ලුම්කාරියගෙන් ඒ පිළිබඳව හරස් ප්‍රශ්න විමසීමේදී හෙළිදරවු වී ඇත්තේ ඇය කිසිවිටෙකත් විනය නියෝගය සම්බන්ධ අභියාචනා නොකළ බවත් තමාගේ උසස් වීම මත වැටුප් ලබා නොදීම සම්බන්ධයෙන් ලිපි ලේඛන හුවමාරු කිරීම පමණක් සිදු කළ බවයි.

ප්‍රශ්ණය : සාක්ෂිකාරිය විනය නියෝගයට පසුව අවස්ථා කීයක් පමණ ඔබේ කළමණාකාරිත්වය වෙත තමන්ගේ විනය නියෝගය සම්බන්ධ ලිපි හුවමාරු කළා ද ?

උත්තරය : උසස් වීම් සඳහා වැටුප් ලබා නොදීම සම්බන්ධයෙන් වාර ගණන මතක නැහැ. නමුත් ලිපි කීපයක් ලබා දුන්නා යනුවෙන් පිළිතුරු ලබා දී ඇත. මේ අනුව ඉල්ලුම්කාරිය විසින් වරින් වර සිදු කරන ලද අභියාචනා මත විනය නියෝගය සංශෝධනය කළ බව වගඋත්තරකාර පාර්ශවය විසින් ඉල්ලුම්කාරියගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී තහවුරු කිරීමට උත්සහ ගත්ත ද එලෙස ඉදිරිපත් වූ අභියාචනා බේරුම්කරණය වෙත ඉදිරිපත් කර අභියාචනා කළ බව තහවුරු කිරීමට වගඋත්තරකාර පාර්ශවය අපොහොසත්ව ඇත. ඒ අනුව සංශෝධිත විනය නියෝගය ඉහත සඳහන් පරිදි ඉල්ලුම්කාරියගේ වුවමනාව මත ඇයගේ අභියාචනා මත සංශෝධනය කළ බව සාක්ෂි තුළින් තහවුරු වී නැත.

iii. කෙසේ වුව ද ඉහළ කළමණාකාරිත්වය විසින් වරින් වර ගන්නා ලද තීරණ මත විනය නියෝගය සංශෝධනය කිරීමට සිදු වූ බව ද වගඋත්තරකරුගේ සාක්ෂියේ සඳහන් වේ. මේ අනුව ආයතන සංග්‍රහයේ XLVII වැනි පරිච්ඡේදයේ 26.1 වගන්තියේ ප්‍රතිපාදන අනුව නොව විනය නියෝගය සංශෝධනය කර ඇත්තේ කළමණාකරිත්වය ගන්නා ලද තීරණ මත බව එකි ප්‍රකාශයෙන්ම තහවුරු වේ. මේ අනුව මුල් විනය නියෝගය ලබා දීමේදී ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන පරිදි විනය පරික්ෂණයක් පවත්වා, චෝදනා පත්‍ර නිකුත් කොට විනය නියෝගය සංශෝධනය කිරීම විධිමත්ව සිදු කළ ද සලකුණු කර ඇති ඒ - 5 සංශෝධිත විනය නියෝගය නිකුත් කිරීමේ දී ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන වලට අනුගතව සංශෝධනය සිදු නොකොට හුදෙක් ඉහළ කළමණාකාරිත්වයේ අභිමතය පරිදි කටයුතු කර ඇත. මෙකී ක්‍රියාවලිය සාධාරණ සහ යුක්ති සහගත නොවේ. තවද

ඉල්ලුම්කාරියව සිය මූලික සාක්ෂි විමසීමේදී ද ''තමාට ලබා දුන් සංශෝධිත විනය නියෝගය කවර රෙගුලාසියක් යටතේ ලබා දුන්නේ ද යන්න තමා නොදන්නා බවට'' ප්‍රකාශ කළ ද ඒ පිළිබඳව කිසිදු හබ කිරීමක් හෝ පැහැදිලි කිරීමක් හෝ පිළිතුරු දීමක් වගඋත්තරකාර පාර්ශවය විසින් ඉල්ලුම්කාරියගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී හෝ වගඋත්තරකාර පාර්ශවයේ සාක්ෂි විමසීමේදී සිදු කර නැත. මේ අනුව විනය නියෝගය සංශෝධනය කිරීමේ කටයුතුවලදී වගඋත්තරකාර පාර්ශවය ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අභිබවමින් ඉහළ කළමනාකාරිත්වයේ අභිමතය මත ඒකපාර්ශවිකව ක්‍රියාකිරීම අයුක්ති සහගත මෙන්ම අසාධාරණ ක්‍රියාවක් බව නිගමනය කරමි.

08. මේ හැර වගඋත්තරකාර පාර්ශවය විසින් ඉල්ලුම්කාරියගෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී -

ප්‍රශ්නය : මම යෝජනා කරනවා 1985 අංක 21 දරන විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 16ඊ වගන්තිය ප්‍රකාරව කාර්යාංශයේ ස්වකීය නිලධරයන් සේවකයන් නියෝජිතයන් පත් කිරීමේ දී ඔවුන්ගේ සේවය අවසන් කිරීමට, පාරිතෝෂික ගෙවීමට සහ පාලනයට සහ එකී කටයුතු පරිපාලනය කිරීමට හා සම්බන්ධ සියලු කාරණා, එය තීරණය කිරීමට කාර්යංශයට බලය පැවරී ඇති බව මෙම අවස්ථාවේ යෝජනා කර සිටිනවා ?

උත්තරය :- ''ස්වාමීණි මට චෝදනා පත්‍රය ලබා දීලා තියෙන්නේ ආයතන සංග්‍රහයට අනුව, ඒ නිසා පනත ක්‍රියාත්මක වුණා ද කියන්න මම දන්නේ නැහැ.''

ඉහත කී ප්‍රශ්නය වගඋත්තරකාර පාර්ශවය විසින් ඉල්ලුම්කාරිය වෙත යෝජනා කරමින් ඇයට ලබා දුන් විනය නියෝගය ලබා දීමට වගඋත්තරකාර පාර්ශවයට බලය ඇති බව පෙන්වා දීමට උත්සාහ ගෙන ඇත. කෙසේ වුව ද ඉල්ලුම්කාරිය කියා සිටින්නේ තමාට චෝදනා පත්‍රයක් ලබා දීම ආයතන සංග්‍රහයට අනුව සිදු වූ බවයි. ඉහතින් සඳහන් කළ පරිදි විනය පරීක්ෂණය, චෝදනා පත්‍ර නිකුත් කිරීම, විනය නියෝගය නිකුත් කිරීම ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව සිදු කළේ නම්, වසර එකකුත් මාස 05ක් ගත වූ පසු විනය බලධාරීන් විසින් නැවතත් එකී නියෝගයම සංශෝධනය කිරීම සඳහා පමණක් 1985 අංක 21 දරන විදේශ සේවා නියුක්ති පනතේ ප්‍රතිපාදන භාවිත කිරීම යුක්තිසහගත සහ සාධාරණ නොවන බව නිගමනය කරමි. විනය නියෝගය සංශෝධනය කිරීම සඳහා ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන සලසා ඇති අතර මුල් විනය කාර්ය පටිපාටිය සඳහා අනුගමනය කළ ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදනම එකී නියෝගය සංශෝධනය සඳහා අදාළ කර ගැනීමට වගඋත්තරකරුවන්ට අවස්ථාව තිබිණි. එසේ අවස්ථාව තිබිය දී වෙනත් පනතක ප්‍රතිපාදන මත කටයුතු කිරීමෙන් මෙම ගැටලු සහගත තත්ත්වය වගඋත්තරකාර පාර්ශවය විසින් නිර්මාණය කර ඇති බව ද නිගමනය කරමි.

09. කෙසේ වුව ද 2018.12.19 දින වගඋත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරු වන කළමනාකරු මානව සම්පත් කේ. ඒ. ඩී. සුසිල් කුමාර පේලි මහතාගෙන් වගඋත්තරකාර පාර්ශවය සාක්ෂි විමසා ඇති අතර ඔහු විසින් ගොනුව බලා සාක්ෂි දී ඇත. තමන් 1991 ජුනි මාසයේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයට බැඳුණ ද මෙම ගැටලුව සම්බන්ධ කටයුතු සඳහා 2018.04.02 දින සම්බන්ධ වූ බැවින් ලේඛන බලා මේ පිළිබඳව සාක්ෂි ලබා දීමේ හැකියාව ඇති බව ප්‍රකාශ කර ඇත. මෙහි දී විනය නියෝගය සංශෝධනය සම්බන්ධයෙන් ගත් පියවර එක්ස් - 1 සිට එක්ස් - 6 දක්වා ලේඛන සලකුණු කරමින් වගඋත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරුගෙන් සාක්ෂි විමසා ඇත. එක්ස් - 1 මගින් මුල් විනය නියෝගය සම්බන්ධයෙන් සභාපතිවරයා විසින් ලේකම්වරයා දැනුවත් කිරීමත් ඉන්පසු ලේකම්වරයා විසින් එකී විනය නියෝගය පිළිබඳව තමා සෑහීමකට පත් නොවන බව එක්ස් - 2 මගින් සභාපතිවරයා වෙත ආපසු දැන්වීමක් කර ඇත. තව ද එකී ලිපියේ සඳහන් පරිදි කේ. යූ. විජේසිංහ නම් අභ්‍යන්තර විගණකවරයකු විසින් මෙම නඩුවේ ''ඉල්ලුම්කාරියට ලබා දී ඇති නියෝගය සම්බන්ධයෙන් ලබා දී ඇති වාර්තාව අනුව '' මෙම විනය නියෝගය සංශෝධනය කරන ලෙස ද ලේකම්වරයා විසින් සභාපතිවරයාට වැඩිදුරටත් එකී එක්ස් -2 ලේඛනයෙන් දන්වා ඇත. මෙම සාක්ෂියේ දී ඉදිරිපත් කර ඇති එක්ස් - 2 ට අමුණා ඇති ලේඛනයේ අභ්‍යන්තර විගණකවරයා විසින් දිනයක් යොදා නොමැති අතර ඔහුගේ රබර් මුද්‍රාව ද තබා නොමැති බැවින් එකී ලේඛනය සාක්ෂියක් ලෙස යොදා ගැනීම සම්බන්ධයෙන් ඉල්ලුම්කාර පාර්ශවය විරෝධතා ඉදිරිපත් කර ඇත. එමෙන්ම හරස් ප්‍රශ්න විමසීමේදී ඒ පිළිබඳව හබ කර ඇත. කෙසේ වුව ද අධ්‍යක්ෂවරයා විසින් එක්ස් - 2 ලේඛනය යොමු කරමින් ඒ සමග අමුණා ඇති ලේඛනයට අනුකූලව විනය නියෝගය සංශෝධනය කරන මෙන් දන්වා තිබීමෙන් ද පෙනී යන්නේ එකී වාර්තාව පදනම් කර ගනිමින් සංශෝධනය කිරීමක් කෙරෙනවා මිස එකී සංශෝධනය සාධාරණව කිරීමට මෙන්ම හෝ ස්වාධීන තීරණ ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තුළින් පත් කළ කමිටුවට ඉඩ කඩ ලබා දී නොතිබූ බවයි.

10. මේ හැර වගඋත්තරකරුගේ සාක්ෂිකරුගෙන් වැඩිදුර හරස් ප්‍රශ්න විමසීම 2019.01.07 දින සිදු කර ඇති අතර, මෙහි දී ඉල්ලුම්කාරියට මුලින් ලබා දුන් විනය නියෝගය අවලංගු කිරීමක් හෝ සංශෝධනය කිරීමක් සිදුව ඇති ද යන්න විමසා ඇත.

''ප්‍රශ්නය :- මහත්මයා ඒ දෙන්නේ දඬුවමනේ. දඬුවම් දෙන්න කලින් නිදොස් කොට නිදහස් කළ පුද්ගලයාගේ

විනය නියෝගය එක්කෝ අවලංගු කරන්න ඕන නැත්නම් සංශෝධනය කරන්න ඕනේ එහෙම වෙලා තියෙනවා ද ? යන්නට ''පිළිතුර : - නැත '' යනුවෙන් පවසා ඇත.

වගඋත්තරකරුගේ පාර්ශ්වය විසින් ඉදිරිපත් කළ සාක්ෂිකරුගේ මෙකී සාක්ෂියෙහි දී ද පැහැදිලි වන්නේ මුල් විනය නියෝගය ''එනම් මෙම නඩුවේ පැමිණිලි පාර්ශ්වය විසින් සිය සාක්ෂියේ දී ලකුණු කොට ඉදිරිපත් කර ඇති ඒ - 3 ලේඛනය මගින් පැනවූ විනය නියෝගය අවලංගු කිරීමක් හෝ සංශෝධනය කිරීමක් සිදු නොකොට ඒ - 5 නමැති ලේඛනය මගින් ''සංශෝධිත විනය නියෝගය'' යන සිරස යටතේ නිකුත් කර ඇති ලේඛනය මගින් ඉල්ලුම්කාරියට දඬුවම් පමුණුවා ඇති බවයි.

මේ අනුව වගඋත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරු විසින්ම මුල් විනය නියෝගය අවලංගු කර හෝ සංශෝධනය කර නොමැති බව පිළිගෙන ඇත. මෙයින් පෙනී යන්නේ මුල් විනය නියෝගය අවලංගු කිරීමක් හෝ සංශෝධනය කිරීමක් විධිමත් පරිදි සිදුකර නොමැති බවයි. එබැවින් එකී මුල් විනය නියෝගය තවදුරටත් බලාත්මකව පවතින බව නිගමනය කරමි.

11. මේ හැර මෙම චෙක්පත් අස්ථාන ගත කළ හෝ අවභාවිත කළ නිශ්චිත පුද්ගලයකු වගඋත්තරකරු විසින් හෝ පොලිස් පරීක්ෂණ මගින් අනාවරණය කර ගත් බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත්ව නැත. 2019.01.07 දින වග උත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී මේ පිළිබඳව ප්‍රශ්න කර ඇත. (සාක්ෂි සටහන් පිටු අංක 04)

ප්‍රශ්නය : - දැන් ඔබ මූලික සාක්ෂි විමසීමේදී ප්‍රකාශ කර තියෙනවා අස්ථානගත වූ චෙක්පත් දෙකක් සම්බන්ධයෙන් තමයි මේ ගැටලුව සිද්ධ වුණේ කියලා ?

උත්තරය : ඔව්

ප්‍රශ්නය : - එතකොට මේ චෙක්පත් දෙක බැංකුවෙන් මුදල් කරලා තියෙන්නේ කවුද ?

උත්තරය : නමක් සඳහන් කරන්න අපහසුයි.

යනුවෙන් ප්‍රකාශ කර ඇත.

මේ අනුව පැහැදිලි වන්නේ මෙම චෙක්පත් අවභාවිතා කළ පුද්ගලයන් කවුරුන් ද යන්න මෙතෙක් වගඋත්තරකාර පාර්ශ්වය විසින් නිශ්චිතව හඳුනාගෙන නොමැති බවයි. ඒ අනුව වරද කළ තැනැත්තා නිශ්චිතව හඳුනා නොගෙන මුදල් අංශයේ සේවය කළ පුද්ගලයකු වන ඉල්ලුම්කාරියට චෙක්පත් අස්ථානගතවීම සම්බන්ධයෙන් දැඩි දඬුවම් පැමිණ වීම සාධාරණ නොවන බව නිගමනය කරමි.

වගඋත්තරකාර පාර්ශ්වය විසින් 2018.10.02 දින සාක්ෂි විමසීමේදී ලකුණු කර බේරුම්කරණය වෙත ඉදිරිපත් කර ඇති XI වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති ලේඛනය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී මේ පිළිබඳව තවදුරටත් කරුණු අනාවරණය වේ. එනම් ලේකම් විදේශ අමාත්‍යාංශය වෙත, සභාපති ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් 2015.08.03 වන දින යවා ඇති ලිපිය ඉහත කී XI ලිපිය වන අතර, එහි සඳහන් ආකාරයට ඉල්ලුම්කාරිය විසින් බැංකු සැසඳුම් පිළියෙළ කිරීමේදී අදාළ මාසයේ බැංකු සැසඳුම් වාර්තාව ඊළඟ මස 15 දිනට පෙර ඉදිරිපත් කළ යුතුව තිබූ අතර, ඇය එකී බැංකු සැසඳුම් පිළියෙළ කර තිබුනේ 16 වන දින වූ අතර එයින් දින එකක ප්‍රමාදයක් සිදුව ඇති නමුදු, අස්ථානගත වූ මුල්ම චෙක්පත සොයා ගෙන ඇත්තේ ද ඇය විසින්ම බව එකී ලේඛනයේ වැඩිදුරටත් සඳහන් ව ඇත. මෙකී කරුණු පදනම් කරගෙන XI වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති ලේඛනයේ ද සඳහන් පරිදි ඉල්ලුම්කාරිය සියලු චෝදනා වලින් නිදොස් කොට ඇත.

කෙසේ වුව ද විනය පරීක්ෂණයේ දී හෝ චෙක්පත් වංචාව පිළිබඳව වගඋත්තරකරු විසින් පොලීසිය වෙත කරන ලද පැමිණිල්ලේ දී හෝ චෙක්පත් අස්ථානගතවීම හෝ වංචා කිරීමට සම්බන්ධ පුද්ගලයන් නිශ්චිතව හඳුනාගෙන නොමැති බව මේ අනුව පෙනී යයි. තව ද ඉහත කී පරිදි ඉල්ලුම්කාරිය විසින් බැංකු සැසඳුම් පිළියෙළ කිරීම ප්‍රමාද කර ඇත්තේ දින එකක් පමණක් වන අතර, චෙක්පත් අස්ථානගතවීම පිළිබඳව මුලින්ම අනාවරණය කරගෙන ඒ බව ඉහළ පාලනාධිකාරියට වාර්තා කර ඇත්තේ ද ඇය විසින්ම ය. ඒ අනුව ඉල්ලුම්කාරිය සිය කාර්ය ඉටු කිරීමේදී එක් දිනක ප්‍රමාදයක් සිදුකළ ද කටයුතු ඉටු නොකර පැහැර හැරීමක් සිදුකර නැත. මේ අනුව චෙක්පත් වංචාව සහ අවභාවිතය සම්බන්ධයෙන් සෘජුවම ඉල්ලුම්කාරියට චෝදනා නැගීම මෙන්ම ඒ පිළිබඳ දැඩි දඬුවම් පැමිණවීම යුක්ති සහගත සහ සාධාරණ නොවන බව නිගමනය කරමි.

11. මේ හැර ඉල්ලුම්කාරියගෙන් මූලික සාක්ෂි විමසීමේදී A5 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කර ඇති ලේඛනයේ, එනම් විනය නියෝගය සංශෝධනය කළ බවට කරුණු දක්වන ලේඛනයේ පහත දැක්වෙන ඌනතාවයන් ඇති බව පෙනී යයි.

i. මුල් විනය නියෝගය අවලංගු කිරීමක් සිදුව නැත.
ii. විනය නියෝගය සංශෝධනයට හේතු දැක්වීමක් කිසිවිටෙකත් සිදුකර නොමැත.
iii. ''විනය නියෝගය සංශෝධනය'' යන සිරසින් යුතුව A5 ලේඛනය නිකුත් කොට තිබුන ද, සංශෝධනය පිළිබඳව කිසිදු සටහනක් එකී ලේඛනයේ නොමැති අතර දඬුවම් නියම කිරීමක් පමණක් සටහන් කර ඇත.
iv. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි,

(අ) 23:1:1 අනුව චූදිත නිලධාරියාට විරුද්ධව අදාළ චෝදනා පත්‍රය මගින් නගා ඇති එක් එක් චෝදනාවට

ඔහු වැරදිකරු ද, නිවැරදිකරු ද යන වග සටහන් කළ යුතු ය.

(ආ) එකී පර්ච්ඡේදයේ 23:1:2 අනුව වරදකරු වී ඇති චෝදනා සහ පමුණුවනු ලැබූ දඬුවම් හා/හෝ කොන්දේසි දැක්විය යුතු ය.

එසේ වුව ද A5 ලේඛනය සංශෝධිත විනය නියෝගය යන සිරසින් යුතුව ආරම්භ කළ ද, ඉහත පරිදි ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව වරදකරුට ඇති චෝදනා එකී නියෝගයේ සටහන් කර නොමැත. අංක 1 සිට 4 දක්වා ඇති දඬුවම් පැමිණවීම පමණක් සිදුකර ඇත. ඒ අනුව A3 වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කර ඇති මුල් විනය නියෝගය විධිමත් පරිදි සංශෝධනය කර නොමැති බව නිගමනය කරමි.

ප්‍රදානය :-

1) ඉහතින් ද සඳහන් කළ පරිදි 2016.12.06 දිනැති සංශෝධිත විනය නියෝගය විධිමත්ව සහ විනිවිදභාවයකින් යුක්තව පනවා නොමැති හෙයින් එකී නියෝගය අවලංගු කරන ලෙසත්, එකී නියෝගය මත පනවා ඇති දඬුවම් ඉවත් කරන ලෙසත්,

2) 2015.07.29 දින පැනවූ ඉල්ලුම්කාරිය විසින් වසර එක හමාරක පමණ කාලයක් භුක්ති විඳින ලද විනය නියෝගය විධිමත් පරිදි අවලංගු නොවී ඇති බැවින් එය තවදුරටත් බලාත්මකව පවතින අතර, එය නැවත ක්‍රියාත්මක කර ඒ අනුව කටයුතු කරන ලෙසත්,

3) 2016.12.06 දිනැති විනය නියෝගය මත විලම්භනය කර ඇති වැටුප් වර්ධක නැවත ක්‍රියාත්මක කර වැටුප් විලම්භනයක් නොවූ සේ සලකා කටයුතු කිරීමටත්,

4) ඉල්ලුම්කාරිය සම්බන්ධයෙන් අංක AD/2/210 සහ 2015.08.26 දිනැති ලිපිය මගින් MV - 1 ශ්‍රේණියේ පරිපාලන නිලධාරී තනතුරට කරන ලද උසස් වීම එලෙසම ක්‍රියාත්මක කරන ලෙසත්,
(ඉහත කී උසස් වීම සම්බන්ධයෙන් වූ වැටුප් ගෙවීම පිළිබඳව සාක්ෂි විමසීමේදී ගෙවූ වැටුප නිශ්චිතව අනාවරණය නොවූ හෙයින් හිඟ වැටුප් ගෙවීම පිළිබඳව නියෝගයක් නොකරයි)

5) කාර්යාංශයට සිදුවූ පාඩුව වශයෙන් ඉල්ලුම්කාරියගේ වැටුපෙන් රුපියල් පන්දහස (රු. 5000/-) බැගින් වාරික වශයෙන් අඩු කිරීම අත්හිටුවා මෙතෙක් අයකර ඇති මුදල වන මෙම නඩුවේ P1 වශයෙන් සලකුණු කර ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති ලේඛනයේ සඳහන් මුදල වන රුපියල් එක්ලක්ෂ හැත්තෑ දහසක මුදල (රු. 1,70,000/-) ඉල්ලුම්කාරියට ආපසු ගෙවීම පිණිස නැගෙනහිර කොළඹ කම්කරු කාර්යාලයේ තැන්පත් කරන ලෙසත්,

වගඋත්තරකරුට මෙයින් නියෝග කරමි. මෙකී ප්‍රදානය ගැසට් පත්‍රයේ පළ වී මාස දෙකක් ඇතුළත ක්‍රියාත්මක විය යුතු ය.

මේ අනුව ඉල්ලුම්කාර පාර්ශවයට එරෙහිව විනය පරීක්ෂණයක් පවත්වා සභාපතිගේ අත්සනින් යුතුව 2015.07.29 දිනැති ලිපිය මගින් සියලුම චෝදනාවලින් නිදොස්කොට නිදහස් කර තිබියදී පසුව AD215/157/2013 සහ 2016.12.06 දිනැති ලිපිය මගින් අදාළ විනය නියෝගය සංශෝධනය කර දඬුවම් ලබාදීම ඉහත සඳහන් කළ පරිදි අයුක්ති සහගත සහ අසාධාරණ ලෙස සිදුකර ඇති බැවින් ඉහත සඳහන් ප්‍රදානයන් කිරීම සාධාරණ සහ යුක්ති සහගත බව ප්‍රකාශ කරමි.

එච්. එම්. අනුලාවතී,
බේරුම්කරු.

2020 ජනවාරි මස 28 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

06 - 145

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.